සැ. යු. - 2021.05.28 දින පළ වූ අංක 2230 දරන *ගැසට් පත්‍රයේ* II, III සහ IV(ආ) කොටස් පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,231 - 2021 ජුනි මස 04 වැනි සිකුරාදා - 2021.06.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1278 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජුනි මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජුනි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1275 - B 82236— 5,403 (2021/06)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය** ඃ

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

**ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත්කර ගැනීම - 2021 වර්ෂය**

2021 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට සිසුන් ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. (*අ*) වයස : 2021.03.31 වැනි දිනට අවුරුදු 16 ත් 22 ත් අතර විය යුතු ය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම;

*හෝ*

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත්වීම.

*විශේෂ කුසලතා* :

විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරගවලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරගවලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් ය.

(*ඇ*) *සැ. යු.*– ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 03ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතු ය.

2. *පාඨමාලා මාධ්‍යය* :

මෙහි දක්වෙන සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර, මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ. තව ද සිංහල භාෂාවේ ප්‍රවීණත්වය මත මෝටර් කාර්මික ශිල්පය හැර අනෙකුත් පාඨමාලා හැදෑරීම පිණිස ද්‍රවිඩ මාධ්‍ය ආධුනිකයින්ට ද අවස්ථාව හිමිවේ. ඉහත (ආ) හි ලන්ඩන් සාමාන්‍ය පෙළ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්කරන්නන්ට සිංහල/දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා හැදෑරීමට හැකියාව තිබිය යුතු ය.

3. *ඇතුළත් කරගැනීමේ පරීක්ෂණය*.– අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

(*අ*) *පවත්වන මාධ්‍යය*.– සිංහල/දෙමළ

(*ආ*) *විභාග මධ්‍යස්ථාන*.– කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය සහ වවුනියාව (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ගේ කැමැත්ත මත වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.)

*විභාගයට අදාළ විෂයයන්*.– ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කාර්මික දැනුම, ඉංග්‍රීසි භාෂා දැනුම සහ, කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු*.– විභාග ගාස්තු වශයෙන් රු. 500 ක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත ගිණුමට බැර කර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය.

*ගිණුම*.—*ගණකාධිකාරී*, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක : 681490.

විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. *මූලික තෝරාගැනීම* :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

6. *අවසන් තෝරා ගැනීම* :

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත.

ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 60%ක් ද වශයෙනි. විෂයය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතු ය.

7. *පුහුණු පාඨමාලා* :

| *අනු. අංකය* | *පාඨමාලාව* | *කාලසීමාව* |
|---|---|---|
| 01 | මෝටර් කාර්මික ශිල්පය | - අවු. 04 |
| 02 | මිල්රයිට් වැද්දුම් ශිල්පය | - අවු. 04 |
| 03 | වායුසමීකරණ/ශීතකරණ ශිල්පය | - අවු. 03 1/2 |
| 04 | බල විදුලි ශිල්පය | - අවු. 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පය | - අවු. 03 1/2 |
| 06 | මෙකාට්‍රොනික් (කර්මාන්ත ගත) ශිල්පය | - අවු. 03 1/2 |
| 07 | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - අවු. 03 |
| 08 | වාහන විදුලි ශිල්පය | - අවු. 03 |
| 09 | පැස්සුම් ශිල්පය | - අවු. 03 |
| 10 | වාහන වායුසමීකරණ ශිල්පය | - අවු. 03 |
| 11 | මෝටර් වාහන, බොඩි අළුත්වැඩියාව හා පින්තාරු ශිල්පය | - අවු. 03 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවන් අනුව ය.

8. *ගිවිසුම් අත්සන් කිරීම* :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු. 04, 03 1/2 සහ 03ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුමකට එළඹිය යුතු ය.

9. *අයදුම්පත්* :
පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයට තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවීම අනිවාර්ය වේ :-

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) අධ්‍යාපන සහතික;

(*ඇ*) ඉහත අංක 1 හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය,

අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2021" යනුවෙන් සඳහන් කළ යුතු ය.

*අයදුම්පත් ලබා ගැනීම* :

- අයදුම්පත් www. cgtti.lk දරන ආයතනීය වෙබ් අඩවියෙන්,
- ආයතනයට පැමිණීමෙන්,
- නම හා ලිපිනය සඳහන් මුද්දර සහිත ලියුම් කවරයක් එවීමෙන් ලබා ගත හැක.

10. *අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය* :

අයදුම්පත් 2021.07.20 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමනාකාර - පරිපාලන හා මානව සම්පත් වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

11. *විභාග ප්‍රවේශපත්‍ර* :

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර 2021.09.10 දින වන විට ලැබීමට සලස්වන අතර, ඒ වන විටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 14ක් ඇතුළත පහත දුරකථන අංකයෙන් විමසිය යුතු ය.

කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්,
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය.

අංක 582, ගාලු පාර,
ගල්කිස්ස,
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංකය : 011-2605625.

## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

*ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත්කර ගැනීම - 2021 වර්ෂය*

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | Q | DQ | විභාග අංකය | | | | | | සම්මුඛ පරීක්ෂණ අංකය | | ආධුනික අංකය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

* ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කිරීමේ දී කැපිටල් ඉංග්‍රීසි අකුරු භාවිතා කළ යුතු ය.
* පහත ( * ) සඳහන් ස්ථානයන්හි ( ✓ ) ලකුණ යොදන්න.

01. (*අ*) සම්පූර්ණ නම : (සිංහලෙන්)

(*ආ*) සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්)

(*ඇ*) මුලකුරු සමග නම : (ඉංග්‍රීසියෙන්)

02. (*අ*) තැපැල් ලිපිනය : (සිංහලෙන්)

(*ආ*) තැපැල් ලිපිනය : (ඉංග්‍රීසියෙන්)

(*ඇ*) දිස්ත්‍රික්කය :

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

(*ඉ*) පළාත :

(*ඊ*) ඊමේල් ලිපිනය :

(*උ*) දුරකථන අංකය :

| ජංගම | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිවස | | | | | | | | | | |

03. (*අ*) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

(*ආ*) 2021.03.31 දිනට වයස :

| අවු | | මාස | | දින | |
|---|---|---|---|---|---|

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :

(ඈ) ස්ත්‍රී/පුරුෂ :

| ස්ත්‍රී | | පුරුෂ | |
|---|---|---|---|

04. අධ්‍යාපන සුදුසුකම් : (අ. පො. ස. සා. පෙළ) - (පළමු වර) දෙවන වර (විශේෂ කුසලතා යටතේ ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණි.)

| *විභාග අංකය* | | *වර්ෂය* | |
|---|---|---|---|
| *විෂයය* | | *සාමාර්ථය* | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| *විභාග අංකය* | | *වර්ෂය* | |
|---|---|---|---|
| *විෂයය* | | *සාමාර්ථය* | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

05. විශේෂ දක්ෂතා යටතේ අයදුම්කරන්නේ නම්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත්කළ පළාත්/ජාතික මට්ටමේ සහතික නිකුත් කළ වර්ෂය හා ක්ෂේත්‍රය :

වර්ෂය : ____ ක්ෂේත්‍රය : ____

06. (අ) අයදුම්කරු ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටීමට කැමති මාධ්‍යය (*)

| සිංහල | | දෙමළ | |
|---|---|---|---|

(ආ) අයදුම්කරු ප්‍රවේශ පරීක්ෂණයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය (*)

| කොළඹ | මහනුවර | ගාල්ල | බදුල්ල | අනුරාධපුරය | වවුනියාව |
|---|---|---|---|---|---|
| | | | | | |

07. (අ) විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාව : ____ (ආ) දිනය : ____

08. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තරවලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය : ____

---

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

| | | | | |
|---|---|---|---|---|
| (අ) බැංකු ලදුපත අමුණා ඇත | ඔව් | නැත | | |
| (ආ) අධ්‍යාපන සහතික පිටපත් අමුණා ඇත | ඔව් | නැත | | |
| (ඇ) උප්පැන්න සහතිකයේ පිටපත අමුණා ඇත | ඔව් | නැත | | |
| (ඈ) අංක 05 යටතේ, විශේෂ දක්ෂතා සහතික අමුණා ඇත | ඔව් | නැත | අදාළ නැත | |
| (ඉ) වයස් සීමාව | -16 | OK | 22+ | |
| (ඊ) ප්‍රවේශ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබා ඇත | ඔව් | නැත | | |
| (උ) පරීක්ෂා කළේ | | | | |

06-26

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018(2021)**

පහත සඳහන් දෙපාර්තමේන්තුවල පවතින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 15ක් පිරවීම සඳහා පැවැත්වීමට නියමිත බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි පහත සුදුසුකම්ලත්, රාජ්‍ය සේවයේ නිරතව සිටින නිලධරයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම **විභාගය 2021 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වේ.** විභාග නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර "**විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ**" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස

ඉහළ කෙළවරේ "**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018(2021)**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

| *අනු අංකය* | *පුරප්පාඩු තනතුර අයත් දෙපාර්තමේන්තුව* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 01 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) | 01 | 01 |
| 02 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 05 | 02 |
| 03 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 04 | 03 |
| | | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 05 | 04 |

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.07.05 දින වේ.

**සටහන** : අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය*.- ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබාගන්නා අපේක්ෂකයන්ගේ වැඩිම ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. ඒ ඒ දෙපාර්තමේන්තුවලට අයත් බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් ආකාරයට එනම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් තනතුරු සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධරයන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

(iv) ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(vi) අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාව සහ ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසිවලට ද ඒ අනුව අදළ තනතුර අයත් දෙපාර්තමේන්තුවල අදළ අනුමත බඳවා ගැනීම් පරිපාටිවල කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය*.- 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 -10x1,335 -8x1,630 - 17x2,170 - රු. 110,895 (SL-1-2016) වේ.

4. *අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද* :

| *අනු. අංක* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම ;<br>සහ<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයකු වීම හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම. |
| 02 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | (I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උද්භිද විද්‍යා හෝ ජීව විද්‍යා හෝ කෘෂිකර්ම විද්‍යා උපාධියක් සහිත යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති MN 4 කේතය යටතේ වැටුප් ලබන නිලධරයකු වීම ;<br>හෝ<br>(II) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වැනි ශ්‍රේණියට උසස්වීම් ලැබ I වන ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධරයකු වීම ;<br>හෝ<br>(III) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම. |
| 03 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | (අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් විශේෂ ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධරයකු වීම ;<br>හෝ<br>(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වැනි ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධරයකු වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම ;<br>හෝ<br>(ඇ) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ විද්‍යාවේදී උපාධියක් (B.Sc) සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධරයකු වශයෙන් වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| | | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | (අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් විශේෂ ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධරයකු හෝ ගොවිපල් කළමනාකරුවකු වීම ;<br>හෝ<br>(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වැනි ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධරයකු හෝ ගොවිපල් කළමනාකරුවකු හෝ වශයෙන් වසර (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;<br>හෝ<br>(ඇ) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ විද්‍යාවේදී උපාධියක් (B.Sc) සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධරයකු හෝ ගොවිපල් කළමනාකරුවකු හෝ ලෙස වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

5. *වයස් සීමාව*.- අදාළ නොවේ.

6. *කායික සුදුසුකම්*.- සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(v) ලිඛිත විභාගයට දෙවතාවකට වඩා පෙනී නොසිටි අයකු විය යුතුය.

8. *ලිඛිත විභාගය* :

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ දැනුම | පැය 3 | 100 | 40 |

8.1.2 *විෂය නිර්දේශය* :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50කින් සමන්විත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. මෙය සියලුම දෙපාර්තමේන්තු සඳහා පොදු ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ දැනුම | එක් එක් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් පරිපාටිවල සඳහන් විෂය නිර්දේශ අනුව එක් එක් දෙපාර්තමේන්තුව සඳහා වෙන වෙනම සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |

8.2 *සම්මුඛ පරීක්ෂණය* :

8.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : (ලකුණු ලබාදෙනු නොලැබේ.)

8.2.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා පහත සඳහන් ලකුණු ලබාදීමේ පරිපාටිය අනුගමනය කරනු ලබන අතර විස්තරාත්මක ලකුණු පරිපාටිය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන අවස්ථාවේ දී අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

(i) *පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව* :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ |
| අතිරේක සේවා කාලය සඳහා | 35 | |
| පරිගණක හැකියාව | 10 | |
| භාෂා ප්‍රවීණතාව | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව | 05 | |

9. *විභාග කොන්දේසි* :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. එම විභාග ගාස්තුව කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හෝ වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ. විභාග ගාස්තු වශයෙන් මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

(iv) අයදුම්පත සෙ. මී. 21-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 01 සිට 3:11 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, අංක 3:12 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතු අතර, අදළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

මේ සමග ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂප කරනු ලැබේ. අදළ අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත *ගැසට්* නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

***සටහන*** : ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම්පත රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් (www.pubad.gov.lk) බාගත කළ හැක.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* : අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(v) අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 හෝ 3ක් ගත වූ පසුවත්, තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. ඔබ තබා ගත් අයදුම්පතේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම වඩාත් ඵලදයී වනු ඇත.

***සටහන*** : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

(vi) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(vii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ :

(i) ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii) වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව

විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

*සැලකිය යුතුය :*

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

10. සියලුම අයදුම්කරුවන් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කර ගත යුතුය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ජේ. ජේ. රත්නසිරි,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2021 මැයි මස 21 වැනි දින,<br>
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරස්‍රය,<br>
කොළඹ 07.

***ආදර්ශ අයදුම්පත***

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

*ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2018(2021)*

**Limited Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Scientific Service - 2018(2021)**

01. විභාගයට පෙනී සිටින මාධ්‍ය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

| | |
|---|---|
| සිංහල | 2 |
| දෙමළ | 3 |
| ඉංග්‍රීසි | 4 |

(අයදුම්පත් සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.)

02. අයදුම්කරන තනතුර :

| *මනාප අංකය* | *තනතුරු නාමය* | *සංකේත අංකය* |
|---|---|---|
| | | |

03. පුද්ගලික තොරතුරු :

3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA )

3.2 මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

Mr./Mrs./Miss :..................................................

(උදා. :- GUNAWARDHANA, H. M. S. K.)

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..................................................

3.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..................................................

(මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

3.5 ස්ථිර ලිපිනය :..................................................

(සිංහලෙන්/දෙමළෙන්)

3.6 තැපැල් නගරය :..................................................

3.7 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.8 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0 [ ] (අදාල අංකය කොටුව තුළ ලියන්න)

3.9 දුරකථන අංකය: ජංගම : | | | | | | | | | | |

ස්ථාවර : | | | | | | | | | | |

3.10 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.11 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.12 ජන වර්ගය : සිංහල - 1 දෙමළ - 2 ඉන්දියන් දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5 [ ]

(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

3.13 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 [ ] (අදළ අංකය කොටුව තුළ ලියන්න.)

3.14 විද්‍යුත් තැපැල් ලිපිනය :..................................................

04. සුදුසුකම් :-

4.1 උපාධිය ලද දිනය :

(මෙම සුදුසුකම ඇද්දැයි බැලීමට නිවේදනයේ (4) වගන්තිය කරුණාකර හොඳින් කියවන්න.)

| *විභාගය/උපාධිය* | *පන්තිය* | *වර්ෂය* | *විෂයන්* | *විශ්වවිද්‍යාලය/ආයතනය* |
|---|---|---|---|---|
| | | | | |

05. සේවය කරනු ලබන දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ :

5.1 දැනට දරන තනතුර :..................................................

5.2 ශ්‍රේණිය :..................................................

5.3 පත්වීම් දිනය :..................................................

5.4 පත්වීම් ස්ථිර කළ දිනය :..................................................

06. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.

| ලදුපතෙහි ඡායා පිටපතක් ළග තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. |
|---|

6.1 කුවිතාන්සි අංකය :..................................................

6.2 ගෙවන ලද තැපැල් කාර්යාලය :..................................................

6.3 දිනය :..................................................

07. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා තිබේද යන්න හා යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම්, එම වරද/විනයානුකූල දඬුවම් පිළිබඳ විස්තර :.......................................................................................................................................................................

08 අයදුම්කරුගේ සහතිකය :-

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය වූත්. නිවැරදි වූත්, තොරතුරු බව සහතික කරන අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලු විධිවිධානයන්ට මම යටත් වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

...................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................

09. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................. මයා./මිය./මෙය ........................ වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාලසීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්‍ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ලම උපයාගෙන ඇති බව ද එම කාලසීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද මෙම අදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව ආශ්‍රයෙන් සොයාගෙන ඇති බව ද අදළ *ගැසට්* නිවේදනයන්හි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බව ද මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද සහතික කරමි.

...................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :.....................
නම :.....................
තනතුර :.....................
ලිපිනය :.....................
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

06-81

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා සීමිත තරග විභාගය (2020/2021)

සීමිත තරග විභාගයක් මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ හා විශේෂ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 442ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ " ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ (සීමිත) තරග විභාගය - 2020/2021" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදිය යුතු ය.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය - 2021.07.30

අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි සම්බන්ධව සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

*01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) පත්වීම් දීම සඳහා තෝරා ගැනීමට ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ හෝ විශේෂ සේවක සංඛ්‍යාවේ එක් එක් විෂයය යටතේ හෝ පවතින පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සංඛ්‍යාව වාචික පරීක්ෂණ මණ්ඩලයට ලබා දෙනු නොලැබේ. වාචික පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමය මෙම නිවේදනයේ අංක 10.2 යටතේ දක්වා ඇත. ලිඛිත පරීක්ෂණය හා වාචික පරීක්ෂණය සඳහා ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව III ශ්‍රේණියේ පුරප්පාඩු පුරවනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවට බලය ඇත.

(ආ) සීමිත තරග විභාගය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම සඳහා බැඳී සිටින අතර ඒ අනුව දිවයිනේ ඕනෑම පළාතක පවත්නා පහත සඳහන් පුරප්පාඩු සඳහා ස්ථානගත කරනු ලැබේ.

වගුව 01: ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම (2020/ 2021) පුරප්පාඩු සංඛ්‍යාව

| *විෂයය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| **සාමාන්‍ය සේවක සංඛ්‍යාව** | 45 |
| **විශේෂ සේවක සංඛ්‍යාව** | |
| සිංහල | 39 |
| දෙමළ | 21 |
| ඉංග්‍රීසි | 25 |
| ගණිතය | 20 |
| විද්‍යාව | 29 |
| වාණිජ විද්‍යාව | 04 |
| තොරතුරු තාක්ෂණය | 21 |
| ශාරීරික අධ්‍යාපනය | 34 |
| ක්‍රිස්තියානි/ කතෝලික ධර්මය | 03 |

| *විෂයය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| හින්දු ධර්මය | 05 |
| ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය | 24 |
| විශේෂ අධ්‍යාපනය | 11 |
| සැලසුම් | 52 |
| ප්‍රාථමික අධ්‍යාපනය | 29 |
| ඉතිහාසය | 29 |
| සෞන්දර්යය | 24 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 09 |
| ජෛව පද්ධති තාක්ෂණය | 18 |
| **එකතුව** | **442** |

*02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1928/28 හා 2015.08.21 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට සිදු කරන ලද සංශෝධන හා මින් මතු කෙරෙන සංශෝධන වලටද රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. විභාගය සඳහා පෙනී සිටින මාධ්‍ය, බඳවා ගැනීමේ මාධ්‍ය වේ.

II. මෙම තනතුර ස්ථිරය.වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.

III. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් (01) අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

IV. භාෂා ප්‍රවීණතාව

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | බඳවා ගැනීමේ දින සිට වසර තුන (03)ක් ඇතුළත සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.<br>සන්ධාන භාෂාවට අදාළ පරීක්ෂණය පිළිබඳව විස්තර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7 පරිශිෂ්ඨයේ දැක්වේ. |

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

VI. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාව මත මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අදාළ තනතුරුවලට පත් කරනු ලැබේ.

03. *වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL- 01- 2016) ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *සුදුසුකම් :*

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මධ්‍යම රජයේ/ පළාත් රාජ්‍ය සේවයට අයත් ගුරු සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්, ගුරු උපදේශක සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ රජයේ අනුමත ආධාර ලබන පාසල්වල හා පිරිවෙන්වල සේවය ස්ථිර කරන ලද ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා පරිවේණාචාර්යවරුන් සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

*සටහන 01:*
මෙම අනුග්‍රහය පිරිවෙන්වල සහ ආධාර ලබන පාසල්වල ගුරුවරුන්ට රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබීමට අයිතිවාසිකමක් නොවේ.

4.1. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව සඳහා -

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් හෝ උපාධියක් ලබා තිබීම;

*හෝ*

II. ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය හෝ ගුරු පුහුණු සහතිකය හෝ ලබා තිබීම.

(ආ) විශේෂ සේවක සංඛ්‍යාව සඳහා -

I. නියමිත විෂයයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් හෝ උපාධියක් ලබා තිබීම; (සටහන 02 හා 03 බලන්න)

*හෝ*

II. නියමිත විෂයය පිළිබඳ ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබීම;

*හෝ*

III. තාක්ෂණය විෂය ධාරාව යටතට ගැනෙන ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමන තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාවක් (NVQ Level 06) ලබා තිබීම.

(විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ නියමිත විෂයය ක්ෂේත්‍රයන් වගුව 03හි දක්වා ඇත.)

*සටහන 02 :*

අයදුම් කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යවශ්‍ය වන අතර, එම විෂයය මුළු විෂයය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) ආවරණය වන පරිදි හදාරන ලද විෂයයක් විය යුතු වේ. තව ද ඉල්ලුම් කරන ලද විෂයය, උපාධියේ මුළු විෂයය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක් (1/3) ආවරණය වන බවට

අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී මඟින්/ විදේශීය විශ්වවිද්‍යාලයකින් නම් එම විශ්වවිද්‍යාලය මඟින් තහවුරු කර තිබිය යුතු අතර එම තහවුරු කිරීමේ සහතිකය/ ලිපිය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුය.

**සටහන 03 :**
මෙම නිවේදනයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරාලන්නේ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම් එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් ආයතනයක් බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගත් තහවුරු කිරීමේ සහතිකයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු වේ.

05. *පළපුරුද්ද :*

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව සඳහා -

I. උපාධි සුදුසුකම සහිත නම්, එම සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර පහ (05)ක සක්‍රීය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ;

*හෝ*

II. ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත නම්, එම සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව අවම වසර හත (07)ක සක්‍රීය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ;

*හෝ*

III. ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සමඟ උපාධි සුදුසුකම ද සම්පූර්ණ කර ඇත්නම් ගුරු පුහුණු හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සුදුසුකම ලබාගැනීමෙන් අනතුරුව වසර පහ (05)ක සක්‍රීය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම ;

*හෝ*

IV. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ගුරු උපදේශක සේවයේ හෝ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරියකු ලෙස, එම තනතුරක වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන 04 :** මෙහි අංක (IV) හි සඳහන් නිලධාරියකු ලෙස, එම තනතුරක වසර පහ (05) කට අඩු සේවා කාලයක් සහිත නම්, ඉහත (I) (II) හා (III) සුදුසුකම්වලින් එම සේවා කාලය සපුරා ගත හැකි වේ.

(ආ) විශේෂ සේවක ගණය සඳහා

I. නියමිත විෂයයට අදාළ උපාධි සුදුසුකම තිබේ නම්, එම සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය, නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම;

*හෝ*

II. නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සමඟ උපාධි සුදුසුකම ද සම්පූර්ණ කර ඇත්නම් ගුරු පුහුණු හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව වසර පහ (05) ක සක්‍රීය, නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම;

*හෝ*

III. නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත නම්, එම සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව අවම වසර හත (07) ක සක්‍රීය නියමිත විෂයය ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම;

*හෝ*

IV. විශේෂ අධ්‍යාපනය/ තාක්ෂණය / ශාරීරික අධ්‍යාපනය යන විෂයය ක්ෂේත්‍රයන් සඳහා විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සහිත නම්, අවම වශයෙන් ආසන්න වසර පහ (05) තුළ නියමිත විෂයය අඛණ්ඩව ඉගැන්වීමේ පළපුරුද්ද සහිත වසර හත (07) ක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම.

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

07. *වෙනත් සුදුසුකම් :*

I. සීමිත තරග විභාගය සඳහා කිසිදු අපේක්ෂකයකුට තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට අවසර නැති අතර විවෘත හා සීමිත යන තරග විභාග දෙකටම එක්ව ගත් විට පස් වතාවකට (05) වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැත.

II. මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

III. සෑම අයදුම්කරුවකුම වසර පහ (05) කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. පත්වීම ස්ථිර කර තිබිය යුතු ය;
(අයදුම් කරනු ලබන දිනට සේවයේ ස්ථිර කිරීමට අදාළ වැඩ බැලීමේ කාල සීමාවක සිටින නිලධාරියකු පූර්ව තනතුරේ සේවය ස්ථිර කර තිබිය යුතු ය)

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

08. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 53 ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1968.07.30 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

09. *අයදුම්කිරීමේ ක්‍රමය :*

I. සේවයේ III ශ්‍රේණියේ සේවක සංඛ්‍යාව සාමාන්‍ය සේවක සංඛ්‍යාවකින් හා විශේෂ සේවක සංඛ්‍යාවකින් සමන්විත වේ. එක් අයදුම්කරුවෙකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අමතරව විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ එක් විෂයයකට පමණක් හෝ විශේෂ සේවක සංඛ්‍යාව යටතේ පමණක් ඉල්ලුම් කරන්නේ නම් විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ විෂයයන් දෙකකට (02) පමණක් හෝ ඉල්ලුම් කළ හැකිය.

II. යම් අපේක්ෂකයෙක් සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ හා විශේෂ සේවක සංඛ්‍යාවේ එක් විෂයයක් යටතේ හෝ විශේෂ සේවක සංඛ්‍යාවේ විෂයයන් දෙකක් යටතේ හෝ සේවයට බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති විට, එම අයදුම්කරු බඳවා ගනු ලබන සේවක සංඛ්‍යාව/ විෂයය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් තීරණය කරනු ලබන අතර, එහිදී අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති මනාප ප්‍රමුඛතාව සැලකිල්ලට ගනු ලබයි.

III. විශේෂ සේවක සංඛ්‍යාව යටතේ බඳවා ගනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක පහත දක්වා ඇත. තමා අයදුම් කරන විෂය ක්ෂේත්‍රය සහ ඊට අදාළ සංකේත අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු අතර එම මනාපයන් කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

වගුව 02 : බඳවා ගනු ලබන විෂයයන් හා අදාළ විෂය අංකයන්

| *විෂය ක්ෂේත්‍රය* | *සංකේත අංක* |
|---|---|
| **සාමාන්‍ය සේවක සංඛ්‍යාව** | 11 |
| **විශේෂ සේවක සංඛ්‍යාව** | |
| සිංහල | 21 |
| දෙමළ | 22 |

| *විෂය ක්ෂේත්‍රය* | *සංකේත අංක* |
|---|---|
| ඉංග්‍රීසි | 23 |
| ගණිතය | 24 |
| විද්‍යාව | 25 |
| වාණිජ්‍ය විද්‍යාව | 26 |
| තොරතුරු තාක්ෂණය | 27 |
| ශාරීරික අධ්‍යාපනය | 28 |
| ක්‍රිස්තියානි/ කතෝලික ධර්මය | 30 |
| හින්දු ධර්මය | 31 |
| ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය | 33 |
| විශේෂ අධ්‍යාපනය | 37 |
| සැලසුම් | 38 |
| ප්‍රාථමික අධ්‍යාපනය | 39 |
| ඉතිහාසය | 40 |
| සෞන්දර්යය | 41 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 43 |
| ජෛව පද්ධති තාක්ෂණය | 44 |

වගුව 03: විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ විෂයය ක්ෂේත්‍රයන් සඳහන් සේවා ව්‍යවස්ථාවේ "ආ" උපලේඛනය.

| *විෂය ක්ෂේත්‍රය* | *බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්* |
|---|---|
| 1. සිංහල<br>2. දෙමළ<br>3. ඉංග්‍රීසි<br>4. ගණිතය<br>5. විද්‍යාව<br>6. වාණිජ්‍ය විද්‍යාව<br>7. තොරතුරු තාක්ෂණය<br>8. ශාරීරික අධ්‍යාපනය<br>9. ක්‍රිස්තියානි/ කතෝලික ධර්මය<br>10. හින්දු ධර්මය<br>11. ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය | (I) නියමිත විෂයයට අදාළ උපාධිය හෝ උපාධියේ කොටසක් ලෙස නියමිත විෂය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම , එය මුළු විෂය ඒකක සංඛ්‍යාවෙන් 1/3ක් වත් අයදුම් කරන විෂයයට අදාළව හදාරා තිබීම.<br>(II) නියමිත විෂයයට අදාළ ගුරු පුහුණු සහතිකය හෝ නියමිත විෂයයට අදාළව ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>(සම්මුඛ පරීක්ෂණයේදී සහතික මඟින් සනාථ කළ යුතු ය.) |
| 12. සෞන්දර්යය | නියමිත විෂයයට අදාළව උපාධි වනුයේ චිත්‍ර, නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය, නාට්‍ය හා රංග කලාව විෂය ක්ෂේත්‍රයේ උපාධි වේ. |
| 13. තාක්ෂණය | |
| (i). ජෛව පද්ධති තාක්ෂණය | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ගෘහ විද්‍යාව, කෘෂි විද්‍යාව, හස්ත කර්මාන්තය, ජීවන නිපුණතා සඳහා වන ගුරු පුහුණු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ලබා තිබීම. |

| | විෂය ක්ෂේත්‍රය | බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් |
|---|---|---|
| | (ii). ඉංජිනේරු තාක්ෂණවේදය | ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් ලබාගත් තාක්ෂණවේදී උපාධියක් හෝ යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රයන්ගෙන් එකකට පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් ලබාගත් ඉංජිනේරු උපාධිය හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතනය මඟින් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ මොරටුව විශ්වවිද්‍යාලය මඟින් පිරිනමන තුන් අවුරුදු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මඟින් පිරිනමන සිව් අවුරුදු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමන තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව (DT) හෝ ශ්‍රී ලංකා තෘතීය සහ වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මඟින් පිරිනමන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට අදාළ උසස් ඩිප්ලෝමාවක් (NVQ Level 06) ලබා තිබීම. |
| 14. විශේෂ අධ්‍යාපනය | | (I) විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම.<br>(II) විශේෂ අධ්‍යාපනය පිළිබඳ රජයේ ගුරු විදුහලකින් ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.<br>(III) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකින් විශේෂ අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |
| 15. සැලසුම් | | පහත දැක්වෙන විෂයය ක්ෂේත්‍රවලින් අවම වශයෙන් එක් ක්ෂේත්‍රයකින් වත් ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඉන් සමත්ව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම.<br><br>විෂය ක්ෂේත්‍රයන්,<br><br>■ සංඛ්‍යාන විද්‍යාව<br>■ ගණිතය විෂය<br>■ කළමනාකරණය<br>■ අධ්‍යාපන විද්‍යාව; මූලධර්ම හා තුලනාත්මක අධ්‍යාපනය<br>■ සමාජ විද්‍යාව<br>■ ජෛව විද්‍යාව<br>■ භෞතික විද්‍යාව<br>■ ආර්ථික විද්‍යාව |
| 16. ප්‍රාථමික අධ්‍යාපනය | | (i) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී, අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගෙන තිබීම.<br>(ii) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ රජයේ ගුරු විදුහලකින් ගුරු පුහුණු සහතිකයක් ලබා තිබීම.<br>(iii) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයකින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |

| *විෂය ක්ෂේත්‍රය* | *බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්* |
|---|---|
| 17. ඉතිහාසය | ඉතිහාසය විෂයය සහිත උපාධියක් ලබා ගෙන තිබීම. |

**සටහන 05 :**

සැලසුම් විෂයය ක්ෂේත්‍රය සඳහා ඉදිරිපත් කරනු ලබන උපාධි සුදුසුකම පහත විෂයය ක්ෂේත්‍ර යටතට ගැනෙන්නේ නම්, එම විෂයයට අදාළව පහත පරිදි ඉගැන්වීමේ පළපුරුද්ද සළකා බලනු ලබයි.

| *විෂය ක්ෂේත්‍රය* | *ඉගැන්වීමේ පළපුරුද්ද සනාථ කළ යුතු විෂයයන්* |
|---|---|
| කළමනාකරණය | වාණිජ්‍ය විද්‍යාව / ව්‍යාපාර අධ්‍යයනය<br>ආර්ථික විද්‍යාව<br>ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය / ගණකාධිකරණය / ගිණුම්කරණය<br>ව්‍යවසායකත්ව අධ්‍යයනය<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>ව්‍යාපාර සංඛ්‍යානය |
| අධ්‍යාපන විද්‍යාව | භූගෝල විද්‍යාව<br>විද්‍යාව<br>ගණිතය<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>ආර්ථික විද්‍යාව<br>ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය<br>ව්‍යවසායකත්ව අධ්‍යයනය |
| සමාජ විද්‍යාව | භූගෝල විද්‍යාව<br>පුරවැසි අධ්‍යාපනය |

**සටහන 06 :**

ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ විෂය ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ පළපුරුද්ද සනාථ කිරීම සඳහා නියමිත වසර ගණන තුළ පාසලෙහි ක්‍රියාත්මක කරන ලද ශිෂ්‍ය උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පිළිබඳ විස්තර හා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කළ යුතු වේ.

10. *බඳවා ගැනීමේ ක්‍රමය :*

**10.1 ලිඛිත විභාගය**

මෙම විභාගය වගුව 04 හි දක්වා ඇති පරිදි ප්‍රශ්න පත්‍ර තුන (03)කින් සමන්විත වේ.

**10.1.1 විෂයය නිර්දේශය.**

**වගුව 04 :** ලිඛිත විභාගයට අදාළ විෂයයන්:

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | අවබෝධය | පැය 01 මි.30 | 100 | 40 |
| 02 | බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40 |
| 03 | අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණය | පැය 01 | 100 | 40 |

**වගුව 05 ඃ විෂය නිර්දේශයඃ**

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | අවබෝධය | අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය, විශ්ලේෂණාත්මක හැකියාව හා නිර්මාණාත්මක බව මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| 02 | බුද්ධි පරීක්ෂණය හා  අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ / කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50කින් යුක්ත වේ.<br><br>බුද්ධි පරීක්ෂණය ඃ<br><br>අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම.<br><br>අභියෝග්‍යතාව ඃ<br><br>පදනම්ගත,  සංඛ්‍යාත්මක සහ රූපකාර සන්ධර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන, ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, නිගමනවලට එළඹීම , තීරණ ගැනීම, සන්නිවේදන කුසලතා ආදී අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම සඳහා සකස් කෙරේ. |
| 03 | අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණය | රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන ප්‍රතිපත්ති, පාසල් අධීක්ෂණය, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අධ්‍යාපන නවීකරණය, ගැටලු හඳුනා ගැනීම හා ගැටලු නිරාකරණය, තීරණ ගැනීමේ හැකියාව ආදී අපේක්ෂකයා සතු කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්න වලින් සමන්විත වේ. |

**10.1.2** මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

**10.2. වාචික පරීක්ෂණය (ලකුණු 25)**

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම, තර්කනය හා ගැටලු විසඳීම, සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය අනුව වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**වගුව 06ඃ** වාචික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක

| *විෂයය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම | 07 |
| 2. තර්කනය හා ගැටලු විසඳීම | 07 |
| 3. සන්නිවේදන කුසලතා | 07 |
| 4. පෞරුෂත්වය | 04 |
| එකතුව | 25 |

II. වාචික පරීක්ෂණයට පෙර බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කර ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබා දෙනු නොලැබේ.

III. ලිඛිත විභාගයෙන් පසු එක් එක් විෂයයන් යටතේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවක් වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සංඛ්‍යාව පමණි.

IV. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

V. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික පරීක්ෂණය පවත්වා අදාළ පත්වීම් ලබා දී අවසන් කළ පසු තවදුරටත් පුරප්පාඩු පවතී නම්, දෙවන වටයක් ලෙස අදාළ පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉතිරි පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව තීරණය කරනු ලබයි.

**10.3 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.**

මෙම නිවේදනයේ 01 (අ) ඡේදයට අනුව ලිඛිත හා වාචික පරීක්ෂණ දෙකටම පෙනී සිට ඉන් ඉහළම සාමර්ථ්‍ය ලැබූවන්ගේ කුසලතා අනුපිළිවෙළට සකසන ලද ප්‍රතිඵල ලේඛනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටු ලේකම් වෙත ලබා දෙනු ඇත. ඒ අනුව අදාළ පත්වීම් ලබාදීමේ කටයුතු අවසන් වීමෙන් පසු අධ්‍යාපන සේවා කමිටුවේ දැනුම්දීම පරිදි විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov. lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ පියවර ගනු ඇත.

11. *විභාග කොන්දේසි :*

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයකුට කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම් පත්‍රයෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා, අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමට ද හැකියාවක් නොමැත.

IV. මෙම විභාගය කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

V. විභාග ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලබන අතර, විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

VI. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

VII. ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22X29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතුය. 01 සිට 05 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 06 සිට ශීර්ෂ දෙවන හා තුන්වන පිටුවලට ද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

VIII. අදාළ අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම විමසා බැලිය යුතු වේ.

IX. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

X. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහ (05)කටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව දැන්වීමේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී ඔබ වෙත තබා ගත් අයදුම්පතේ ඡායා පිටපත ද, ලියාපදිංචි ලදුපත ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට හැකි ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඔබගේ ඉල්ලීම් ලිපිය 011-2784232 ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

XI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

XII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. තව ද, රටේ පවතින නිරෝධායන නීතිරීතිවලට ද අපේක්ෂකයින් අවනත විය යුතු වේ.

XIII. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලේඛනයක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XIV. අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවය අවසන් කිරීමට/ පෙර සිටි තනතුරට ආපසු යැවීමට/ සේවයෙන් පහකිරීමට කටයුතු කෙරෙනු ඇත.

XV. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සේවය සඳහා විධිමත්ව මුදා හැර ඇති රජයේ ස්වෙච්ඡා බල හමුදාවේ හෝ ස්වෙච්ඡා උප සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන තමා සේවය කරනු ලබන ආයතනයේ ප්‍රධානියා මගින් සහතික කර ගත යුතු වේ.

XVI. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන ලද මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා,
ලේකම්.

2021 මැයි මස 28 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020/2021**

**Limited Competitive Examination for Recruitment to Grade 111 of the Sri Lanka Education Administrative Service - 2020/2021**

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(විභාගය සඳහා පෙනී සිටින මාධ්‍යම බඳවා ගැනීමේ මාධ්‍ය ද වේ)

[ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින "සේවක සංඛ්‍යාව"

සාමාන්‍ය සේවක සංඛ්‍යාවට පමණි - 1
විශේෂ සේවක සංඛ්‍යාවට පමණි - 2
සාමාන්‍ය හා විශේෂ සේවක සංඛ්‍යාව යන දෙකටම - 3

[ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

*ගැසට්* නිවේදනයට අනුව ඉල්ලුම් කරන විෂය ක්ෂේත්‍රය හා සංකේත අංකය තම මනාපයෙහි ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව පහත දැක්වෙන වගුවෙහි සඳහන් කරන්න :

| *ප්‍රමුඛතා අනුපිළිවෙළ* | *සේවක සංඛ්‍යාවේ නම* | *විෂය ක්ෂේත්‍රයේ නම* | *සංකේත අංකය* |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):..........................................................
1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):.........................
(උදා : SILVA, G. A.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්): ..........................................................

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) - ..........................................................
2.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ...............................................
2.4 රාජකාරි ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) - ................................................
2.5 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -............................

3.0 3.1 පෞද්ගලික දුරකථන අංකය හා ෆැක්ස් අංකය - දු:ක : [ | | | | | | | | | | ]
(තිබේ නම් පමණක්) ෆැක්ස් : [ | | | | | | | | | | ]

3.2 රාජකාරි දුරකථන අංකය හා ෆැක්ස් අංකය - දු:ක : [ | | | | | | | | | | ]
ෆැක්ස් : [ | | | | | | | | | | ]

3.3 විද්‍යුත් තැපැල් ලිපිනයඃ .................................................

4.0 ස්ත්‍රී පුරුෂ භාවයඃ

| | | | |
|---|---|---|---|
| පුරුෂ | - | 0 | ☐ |
| ස්ත්‍රී | - | 1 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 ජාතික හැඳුනුම්පත් අංකයඃ ☐☐☐☐☐☐☐☐☐☐☐☐

6.0 6.1 විවාහක / අවිවාහක බවඃ ☐

| | | | |
|---|---|---|---|
| අවිවාහක | - | 1 | (අදාළ අංකය කොටුව තුළ ලියන්න) |
| විවාහක | - | 2 | |

6.2 උපන් දිනයඃ

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.3 2021.07.30 දිනට වයස ඃ

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

7.0 මෙම තනතුර ඉල්ලුම් කිරීම සඳහා අදාළ අධ්‍යාපන/ වෙනත් සුදුසුකම් ඃ

7.1 උපාධිය / වෙනත් සුදුසුකම් ඃ .........................................................

7.2 අදාළ විශ්වවිද්‍යාලය/ ආයතනය ඃ .....................................................................

7.3 විශ්වවිද්‍යාලයේ / ආයතනයේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය ඃ............................................

7.4 උපාධිය / අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ භාෂා මාධ්‍යය ඃ........................................

7.5 උපාධිය/ සුදුසුකමට අදාළ විෂයයන් ඃ....................................................

7.6 එම උපාධිය / සුදුසුකම සම්පූර්ණ කරන ලද (වලංගු වන) දිනය ඃ ..........................

7.7 පංති සාමර්ථ්‍ය (පංති සාමර්ථ්‍යක් ලබා ඇත්නම් පමණි) ඃ .................................

8.0

8.1 අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව මුලින්ම රජයේ සේවයට පත් වූ දිනය ඃ ...............

8.2 වර්තමාන සේවයඃ .................................

8.3 වර්තමාන සේවා ස්ථානය ඃ ...........................................................

8.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සේවා කාලය - අවුඃ...... මාසඃ....... දිනඃ.....

9.0

9.1 ගුරු පුහුණුව ලත් වර්ෂය : ..........................................................

9.2 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ/ ගුරු විදුහලේ නම : .....................................

9.3 පුහුණු සහතිකය වලංගු වන දිනය : ..........................................................

9.4 පුහුණුව ලත් විෂයය ක්ෂේත්‍රය : ..........................................................

9.5 පුහුණුවට අදාළ විෂයය සඳහා ගුරු පත්වීම ලද දිනය : ......................................

9.6 එම පත්වීම දින සිට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සේවා කාලය -

අවු:...... මාසඃ.......... දිනඃ.........

10.0 ඔබ දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරනු ලැබ ඇත්තේ ද ? : .................................

11.0 මීට ප්‍රථම සීමිත විභාගයට හා විවෘත තරග විභාගයට පෙනී සිටි වාර ගණන සහ වර්ෂයන් :

| *විභාගය* | *වර්ෂයන්* | *වාර ගණන* |
|---|---|---|
| සීමිත | | |
| විවෘත | | |

12.0 විභාග ගාස්තුඃ

විභාග ගාස්තු රු. 1,200 ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගන්න.

13.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය බවත්, නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............................. හා ............................. දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුව ද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

.............................., ........................................,
දිනය. අයදුම්කරුගේ අත්සන.

14.0 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

මෙම අයදුම්පත ඉදිරිපත් කරන (පූජ්‍ය) ............................................................................ මහතා/ මහත්මිය/මෙනවිය මෙම විද්‍යාලයේ .......................... වශයෙන් සේවය කරන බව මෙයින් සහතික කරමි.

.............................., ........................................,
දිනය විදුහල්පති
(අත්සන හා නිල මුද්‍රාව)

15.0 විභාග කොමසාරිස් ජනරාල්,

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන (පූජ්‍ය ) ........................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මෙම කලාපයට අයත් ................................................. විද්‍යාලයේ/ ආයතනයේ ....................................................................... ලෙස සේවය කරනු ලබන බවත්,

2021......................... දිනට වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමකට යටත් කර නොමැති බවත්, අංක 01 සිට අංක 11 දක්වා වූ ඡේදවල සඳහන් කරන ලද විස්තර කාර්යාලයේ ඇති ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවත්, සහතික කරමි.

.............................., ........................................,
දිනය. පළාත් අ.ලේ./පළාත් අ.අ./ කලාප අ.අ./
ආයතන ප්‍රධානී.
(අත්සන හා නිල මුද්‍රාව)

06 - 193/1

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි**

සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - (2020 / 2021)

සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරුවල පවතින පුරප්පාඩු 67ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. සියලු සුදුසුකම් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වන විට සම්පූර්ණ කර තිබිය යුතුය. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2020/2021" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය - 2021.07.30.

අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි සම්බන්ධව සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පතක් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) ලිඛිත විභාගයෙන් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් ලිඛිත විභාගයෙන් හා සේවා පළපුරුද්ද යන අංශ දෙකෙන්ම ලැබූ මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව, පත්වීම සඳහා තෝරා ගනු ලැබේ. පත්වීම් ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවට බලය ඇත.

(ආ) සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද කිසියම් අපේක්ෂකයකු නියමිත සුදුසුකම් සපුරා නොතිබේ නම් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව ලේඛනයේ ඊළඟ අපේක්ෂකයා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1928/28 හා 2015.08.21 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථා සංග්‍රහයට සිදු කරන ලද සංශෝධන හා මින් මතු කෙරෙන සංශෝධනවලට ද, රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. විභාගය සඳහා පෙනී සිටින මාධ්‍ය බඳවා ගැනීමේ මාධ්‍ය වේ.

II. මෙම තනතුර ස්ථිරය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.

III. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු (01) වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

IV. භාෂා ප්‍රවීණතාව

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |
| සන්ධාන භාෂාව | බඳවා ගැනීමේ දින සිට වසර තුන (03)ක් ඇතුළත සන්ධාන භාෂාව (ඉංග්‍රීසි භාෂාව) පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.<br>සන්ධාන භාෂාවට අදාළ පරීක්ෂණය පිළිබඳව විස්තර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7 පරිශිෂ්ඨයේ දැක්වේ. |

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි හෝ මින් ඉදිරියට කලින් කලට සිදුකරනු ලබන්නා වූ සංශෝධන මෙම තනතුර සඳහා අදාළ වේ.

VI. III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාව මත මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරුවලට පත් කරනු ලැබේ.

03. *වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මෙම තනතුරට රු.47,615 - 10 X 1,335 - 8 x 1,630 - 17 x 2,170 - 110,895 (SL-01-2016) ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

04. *සුදුසුකම් :*

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති හා දැනට සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරියකු සේවා පළපුරුද්ද හා කුසලතාව මත පත් කරනු ලැබීම සඳහා වන විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

I. අයදුම්පත් භාර ගනු ලබන අවසාන දින වන විට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 වන ශ්‍රේණියේ අවුරුදු 03ක අවම සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

II. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවෙහි 17.4.3 ඡේදයේ (ආ) වගන්තියේ සඳහන් කොන්දේසි මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරියෙකු නම්, එම සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව අදාළ අනෙකුත් සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

III. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම ස්ථිර කර තිබීම;

IV. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්ව හෝ ඉන් නිදහස්ව තිබීම ;

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

05. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

06. *වෙනත් සුදුසුකම් :*

I. සේවා පළපුරුද්ද හා කුසලතාව මත බඳවා ගැනීමේ තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැති අතර, සීමිත සහ සේවා පළපුරුද්ද හා කුසලතාව මත බඳවා ගැනීම සඳහා වන විභාග දෙකටම පස් (05) වරකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැත.

II. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සේවා පළපුරුද්ද හා කුසලතාව මත විභාගයට හා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 58ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1963.07.30 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

08. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයේ ප්‍රතිඵල හා සේවා පළපුරුද්ද මත බඳවා ගනු ලැබේ.

**8.1 ලිඛිත විභාගය**

මෙම විභාගය වගුව 01හි දක්වා ඇති පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

**8.1.1 විෂයය නිර්දේශය**

**වගුව 01** : ලිඛිත විභාගයට අදාළ විෂයයන්

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | තුලනාත්මක අධ්‍යාපනය | පැය 01 | 100 | 40 |
| 02 | අධ්‍යාපන පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය | පැය 01 | 100 | 40 |

**වගුව 02**: විෂය නිර්දේශය

| | විෂයය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | තුලනාත්මක අධ්‍යාපනය | ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති හා අණ පනත්, අධ්‍යාපන ආයතනවල කාර්යභාරයන්, මෑත කාලීන අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන් හා ජාත්‍යන්තර ප්‍රවණතා පිළිබඳව සංසන්දනාත්මකව අගය කිරීම මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂා කෙරේ. |
| 02 | අධ්‍යාපන පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය | අධ්‍යාපන පරිපාලනය/ කළමනාකරණ ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර එම සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම හා ගැටලු නිරාකරණය පිළිබඳව අපේක්ෂකයාගේ හැකියාව මැන බැලීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. |

**8.1.2** මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.2 *සේවා පළපුරුද්ද සඳහා ලකුණු :*

I. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයෙන්, බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් ලෙස නියම කර ඇති වසර තුන අඩු කළ පසු ඊට අතිරේක වශයෙන් 1 වැනි ශ්‍රේණියේ සේවය කර ඇති සෑම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සඳහා එක් අවුරුද්දකට ලකුණු 3 බැගින් උපරිම ලකුණු 60ක් සේවා පළපුරුද්ද සඳහා ලබා දෙනු ලැබේ.

II. ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවෙහි 17.4.3 ඡේදයේ (ආ) වගන්තියේ සඳහන් කොන්දේසි මත 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්, එම සේවා ව්‍යවස්ථානුකූලව අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ලබාගෙන ඇති කාලය ද, අධි සේවක පදනම මත පත්වීම් ලබා ඇති නිලධාරීන්ගේ අධි සේවක සේවා කාලය ද මෙහි දී සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සලකනු නොලැබේ.

III. ලකුණු ලබාදෙනුයේ සම්පූර්ණ වසරක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා පමණි.

8.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

8.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

8.3.2. බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් හා බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කිරීම මෙම සම්මුඛ පරීක්ෂණයේ අපේක්ෂිත අරමුණ වේ.

I. සේවා පළපුරුද්ද හා ලිඛිත විභාගය සඳහා ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයට සමාන සංඛ්‍යාවක් පමණක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවනු ලැබේ.

II. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද කිසියම් අපේක්ෂකයකු හෝ අපේක්ෂකයින් සංඛ්‍යාවක් නියමිත සුදුසුකම් සපුරා නොතිබීමෙන් යම්කිසි පුරප්පාඩුවක් ඇතිවුවහොත් කුසලතා අනුපිළිවෙළ අනුව ලේඛනයේ ඊළඟ අපේක්ෂකයින් එම පුරප්පාඩුව සඳහා කැඳවනු ලැබේ.

III. අවසාන පුරප්පාඩුව හෝ අවසාන පුරප්පාඩු කිහිපයක් සඳහා සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින විට, එම පුරප්පාඩුව හෝ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

IV. මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අපේක්ෂකයින්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

8.4 *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :*

මෙම නිවේදනයේ 01 (අ) හා (ආ) ඡේද අනුව ලිඛිත පරීක්ෂණයෙන් හා සේවා පළපුරුද්ද මත ලබා ගන්නා ලකුණු වල මුළු එකතුවේ කුසලතාව පදනම් කර සකසන ලද ප්‍රතිඵල ලේඛනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටු ලේකම් වෙත ලබා දෙනු ඇත. ඒ අනුව අදාළ පත්වීම් ලබාදීමේ කටයුතු අවසන්වීමෙන් පසු අධ්‍යාපන සේවා කමිටුවේ දැනුම්දීම පරිදි විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ පියවර ගනු ඇත.

09. *විභාග කොන්දේසි :*

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයකුට කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා, අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමට ද හැකියාවක් නොමැත.

IV. මෙම විභාගය කොළඹදී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

V. විභාග ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලබන අතර, විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

VI. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

VII. අයදුම්පත සෙ.මී. 22 X 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතුය. 01 සිට 05 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, 06 සිට ශීර්ෂ දෙවන හා තුන්වන පිටුවලට ද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය.

VIII. අදාළ අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින්ම විමසා බැලිය යුතු වේ.

IX. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

X. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහ (05)කට වත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව දැන්වීමේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී ඔබ වෙත තබා ගත් අයදුම්පතේ ඡායා පිටපත ද, ලියාපදිංචි ලදුපත ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට හැකි ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඔබගේ ඉල්ලීම් ලිපිය 011-2784232 ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

XI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

XII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. තවද රටේ පවතින නිරෝධායන නීතිරීතිවලට ද අපේක්ෂකයින් අවනත විය යුතු වේ.

XIII. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලේඛනයක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XIV. අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවය අවසන් කිරීමට/ පෙර සිටි තනතුරට ආපසු යැවීමට/ සේවයෙන් පහකිරීමට කටයුතු කෙරෙනු ඇත.

XV. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සේවය සඳහා විධිමත්ව මුදා හැර ඇති රජයේ ස්වෙච්ඡා බල හමුදාවේ හෝ ස්වෙච්ඡා උප සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන තමා සේවය කරනු ලබන ආයතනයේ ප්‍රධානියා මඟින් සහතික කර ගත යුතු වේ.

XVI. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වේ.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන ලද මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ, සලකා කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා,
ලේකම්.

2021 මැයි මස 28 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**ආදර්ශ අයදුම්පත**

සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020/2021

**Competitive Examination for Recruitment to Grade 111 of the Sri Lanka Education Administrative Service on the Basis of Service Experience and Merit - 2020/2021**

විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(විභාගය සඳහා පෙනී සිටින මාධ්‍යම බඳවා ගැනීමේ මාධ්‍ය ද වේ)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):............................................................
1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):.........................
(උදා : SILVA, G. A.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්): ............................................................

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ............................................................
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) - ............................................................

2.3 රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..............................................

2.4 රාජකාරී ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) - ..............................................

2.5 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -............................

3.0 3.1 පෞද්ගලික දුරකතන අංකය හා ෆැක්ස් අංකය - දුෘක :
(තිබේ නම් පමණක්) ෆැක්ස් :

3.2 රාජකාරී දුරකතන අංකය හා ෆැක්ස් අංකය - දුෘක :
ෆැක්ස් :

3.3 විද්‍යුත් තැපැල් ලිපිනයඃ ..............................................

4.0 ස්ත්‍රී පුරුෂ භාවයඃ

පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 ජාතික හැඳුනුම්පත් අංකයඃ

6.0 6.1 විවාහක / අවිවාහක බවඃ

අවිවාහක - 1
විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6.2 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

6.3 2021.07.30 දිනට වයස :

අවුරුදු : මාස : දින :

7.0 මීට ප්‍රථම සීමිත විභාගයට හා සේවා පළපුරුද්ද හා කුසලතා තරග විභාගයට පෙනී සිටි වාර ගණන සහ වර්ෂයන් :

| *විභාගය* | *වර්ෂයන්* | *වාර ගණන* |
|---|---|---|
| සීමිත | | |
| සේවා පළපුරුද්ද හා කුසලතාවය | | |

8.0. සේවා විස්තර : (මෙම වගුව සම්පූර්ණ කරන්න)

| *අනු. අංකය* | *පත්වීම/තනතුර* | *පත්වීම්/උසස් කිරීම්/ අන්තර්ග්‍රහණ දිනය* | *පත්වීම් / උසස් කිරීම් / අන්තර්ග්‍රහණ ලිපියේ අංකය හා දිනය* |
|---|---|---|---|
| **i** | විදුහල්පති සේවයේ මුල් පත්වීම | | |
| ii | විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය (අදාළවේ නම් පමණි) | | |
| iii | නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය | | |
| iv | විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට උසස් කිරීම | | |
| v | පත්වීම අධි සේවක පදනම මත නම්, විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය | | |

(මෙම වගුව සම්පූර්ණ කරන්න)

| *vi* | *වර්තමාන තනතුර හා එම තනතුරට පත් කළ දිනය* | *වර්තමාන සේවා ස්ථානය පිළිබඳ තොරතුරු* | | | |
|---|---|---|---|---|---|
| | | වර්තමාන සේවා ස්ථානයේ නම | වර්තමාන සේවා ස්ථානයේ ලිපිනය | වර්තමාන සේවා ස්ථානය අයත් කලාපය | වර්තමාන සේවා ස්ථානය අයත් පළාත |
| | | | | | |
| | | | | | |

9.0 සහභාගි වී ඇති පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර : (මෙම වගුව සම්පූර්ණ කරන්න)

| *අනු. අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *ආයතනය* | *පුහුණු පාඨමාලාව සම්පූර්ණ කරන ලද වර්ෂය* |
|---|---|---|---|
| i | | | |
| ii | | | |

10.0 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ :

| *කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ* | *සම්පූර්ණ කරන ලද / සමත් වන දිනය* |
|---|---|
| පළමු | |
| දෙවන | |

11.0 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :

(මෙම වගුව සම්පූර්ණ කරන්න)

| *වර්ෂය* | *දඬුවම් පිළිබඳ විස්තර* |
|---|---|
| | |
| | |

12.0 ඔබට විරුද්ධව දැනට කිසියම් විනයානුකූල පරීක්ෂණයක් පවත්වමින් තිබේ නම් එහි වර්තමාන තත්ත්වය :

(මෙම වගුව සම්පූර්ණ කරන්න)

| වර්ෂය | විනය/ විමර්ශන/විගණන ක්‍රියාමාර්ගයන්හි වර්තමාන තත්ත්වය |
|---|---|
| | |
| | |

13.0 ශ්‍රී ලං.වි.සේ. 1 ශ්‍රේණියට උසස් වූ දින සිට වැටුප් වර්ධක උපයා ගැනීම පිළිබඳ විස්තර -

(මෙම වගුව සම්පූර්ණ කරන්න)

| වර්ෂය | වැටුප් වර්ධක උපයා ගෙන ඇති/ නැති බව | වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම් ඊට හේතු |
|---|---|---|
| | | |
| | | |

14.0 ශ්‍රී ලං.වි.සේ. 1 ශ්‍රේණියට උසස් වූ දින සිට වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :

(මෙම වගුව සම්පූර්ණ කරන්න)

| වර්ෂය | වැටුප් රහිත නිවාඩු කාලය | අඩ වැටුප් සහිත නිවාඩු කාලය |
|---|---|---|
| | ................. සිට ............... දක්වා | ................. සිට ........... දක්වා |
| | ................. සිට ............... දක්වා | ................. සිට ........... දක්වා |
| | ................. සිට ............... දක්වා | ................. සිට ........... දක්වා |

ඉහත සඳහන් කර ඇති විස්තර අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට සේවා පළපුරුද්ද හා කුසලතාව මත පත්කිරීම සඳහා සලකා බැලීමට මා සුදුසු බවත් මෙම අයදුම්පතේ මා සපයා ඇත්තා වූ තොරතුරු නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

........................ ......................................,
දිනය. අපේක්ෂකයාගේ අත්සන.

15.0 විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත 01 සිට 14 දක්වා සඳහන් කර ඇති සේවා විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි. තවද නියමිත විභාග ගාස්තුව රු.1,200/- ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවද සහතික කරමි.

......................................,
පළාත් අ.ලේ./පළාත් අ.අ./ කලාප අ.අ./
ආයතන ප්‍රධානී.
(අත්සන හා නිල මුද්‍රාව)

දිනය - ..............

| |
|---|
| විභාග ගාස්තු රු. 1,200/- ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

06 - 193/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

## 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජුනි** | 2021.06.04 | සිකුරාදා | 2021.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.11 | සිකුරාදා | 2021.05.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.18 | සිකුරාදා | 2020.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.25 | සිකුරාදා | 2020.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2021.07.02 | සිකුරාදා | 2021.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.09 | සිකුරාදා | 2021.06.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.16 | සිකුරාදා | 2020.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.22 | බ්‍රහස්පතින්දා | 2020.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.30 | සිකුරාදා | 2020.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2021.08.06 | සිකුරාදා | 2021.07.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.08.13 | සිකුරාදා | 2021.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.20 | සිකුරාදා | 2020.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.27 | සිකුරාදා | 2020.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.